ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2514/31 - 2026 නොවැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2026.11.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

උපලේඛනය

I වන තීරය				*II වන තීරය*
වෙළෙඳ භාණ්ඩය				*විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද*
	සං.වෙ. ශීර්ෂය	*සං.වෙ. සංකේතාංකය*	*විස්තරය*	
1	03.05	0305.54.10	හාල් මැස්සන්	කිලෝ ග්‍රෑමයට රු. 10.00
2		0305.59.10	උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක	කිලෝ ග්‍රෑමයට රු. 10.00
3	09.04	0904.21.10	මිරිස් - වියළි කුඩු නොකළ හෝ නොඇඹරූ	කිලෝ ග්‍රෑමයට රු. 50.00
		0904.22.10	මිරිස් - වියළි කුඩු කළ හෝ ඇඹරූ	කිලෝ ග්‍රෑමයට රු. 75.00
		0904.22.90	අනෙකුත් - කුඩු කළ හෝ ඇඹරූ	කිලෝ ග්‍රෑමයට රු. 75.00
4	17.01		ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස්	
			අනෙකුත් :	
		1701.91	එකතු කරන ලද රසකාරක හෝ වර්ණක අඩංගු :	

උපලේඛනය (සම්බන්ධිතයි)

I වන තීරය				*II වන තීරය*
වෙළෙඳ භාණ්ඩය				*විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද*
	සං.ව. ශීර්ෂය	*සං.ව. සංකේතාංකය*	*විස්තරය*	
		1701.91.10	පොලරිමීටරයේ 99.7^0 ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත	කිලෝ ග්‍රෑමයට රු. 60.00
		1701.91.20	පොලරිමීටරයේ 99.5^0 ට වැඩි හෝ සමාන සහ 99.7^0 ට අඩු සංඛ්‍යාත සහිත	කිලෝ ග්‍රෑමයට රු. 60.00
		1701.99	අනෙකුත් :	
		1701.99.10	පොලරිමීටරයේ 99.7^0 ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත උක් සීනි	කිලෝ ග්‍රෑමයට රු. 60.00
		1701.99.20	පොලරිමීටරයේ 99.5^0 ට වැඩි හෝ සමාන සහ 99.7^0 ට අඩු සංඛ්‍යාත සහිත උක් සීනි	කිලෝ ග්‍රෑමයට රු. 60.00
		1701.99.30	පොලරිමීටරයේ 99.7^0 ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත බීට් සීනි	කිලෝ ග්‍රෑමයට රු. 60.00
		1701.99.40	පොලරිමීටරයේ 99.5^0 ට වැඩි හෝ සමාන සහ 99.7^0 ට අඩු සංඛ්‍යාත සහිත බීට් සීනි	කිලෝ ග්‍රෑමයට රු. 60.00
		1701.99.90	අනෙකුත් :	කිලෝ ග්‍රෑමයට රු. 60.00

2. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ 2025 දෙසැම්බර් මස 31 දිනැති අංක 2469/12 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයෙහි දක්වා ඇති හාල් මැස්සන් (සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0305.54.10), උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක (සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0305.59.10), වියළි මිරිස් (සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0904.21.10,0904.22.10.0904.22.10,0904.22.90) සහ සුදු සීනි (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 17.01) මත පනවන ලද විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද, 2026 නොවැම්බර් මස 13 වැනි දින සිට බලාත්මක වන පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ.

3. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ වූ මෙම නියමය, එකී පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව 2026 නොවැම්බර් මස 13 දිනෙන් ආරම්භ වී 2027 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාවක් සඳහා වලංගුව පැවතිය යුතුය.

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 11 - 0093

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.